# (29) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

අ.පො.ස.(උ.පෙළ) විභාගය : 2020 - 2021 වර්ෂ සඳහා පමණක් අදාළ වේ.

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය :-** **කාලය පැය 02යි.**

මෙම ප්‍රශ්න පත්‍රය A, B හා C යනුවෙන් කොටස් තුනකින් (03) සමන්විත වේ.

**A කොටස (නව සහ පැරණි නිර්දේශ සඳහා)** - වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 25කි. ඒවා 2008 (පැරණි) සහ 2018 (නව) විෂය නිර්දේශවලට **පොදු** විෂය කොටස්වලින් සකස් කෙරේ. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 25කි.

- B හෝ C යන කොටස් අතුරින් **එක් කොටසක් පමණක්** තෝරාගෙන ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය.

**B කොටස (පැරණි නිර්දේශය සඳහා)** - **2008 (පැරණි) විෂය නිර්දේශයට** අදාළ ව සකස් කළ වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 25කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 25කි.

**C කොටස (නව නිර්දේශය සඳහා)** - **2018 (නව) විෂය නිර්දේශයට** අදාළ ව සකස් කළ වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 25කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 25කි.

I පත්‍රය සඳහා මුළු ලකුණු

| | | | |
|---|---|---|---|
| **A කොටස** | - | $1 \times 25$ | = ලකුණු 25 |
| **B/ C කොටස** | - | $1 \times 25$ | = ලකුණු 25 |
| | | | මුළු ලකුණු 50 |

**II පත්‍රය :-** **කාලය පැය 03යි.** (ඊට අමතරව කියවීමේ කාලය මිනිත්තු 10යි.)

මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.

- A කොටසින් ප්‍රශ්න **දෙකක් (02)** සහ B කොටසින් ඕනෑම ප්‍රශ්න **තුනක් (03)** තෝරාගෙන ප්‍රශ්න **පහකට (05) පමණක්** පිළිතුරු සැපයිය යුතුය.

**A කොටස** - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකින්** (03) සමන්විත වේ. ඒවා 2008 (පැරණි) සහ 2018 (නව) විෂය නිර්දේශ දෙකටම **පොදු** විෂය කොටස්වලින් සකස් කෙරේ.

**B කොටස** - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **අටකින්** (08) සමන්විත වේ. එහි **4, 5, 6** සහ **7** ප්‍රශ්න 2008 (පැරණි) විෂය නිර්දේශය අනුව සකස් කර ඇත. **8, 9, 10** සහ **11** ප්‍රශ්න 2018 (නව) විෂය නිර්දේශය අනුව සකස් කර ඇත.

II පත්‍රය සඳහා මුළු ලකුණු = $05 \times 40 = 200$

අවසාන ලකුණ ගණනය කිරීම :-

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | | = | 50 |
| II පත්‍රය | $= 200 \div 4$ | = | 50 |
| අවසාන ලකුණ | | = | 100 |

## I පත්‍රය
## A කොටස

01. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර භූමිකාව එකිනෙක හුවමාරු වන ආකාරය දක්වන ආකෘතිය කුමක් ද?
(1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් (2) ඔස්ගුඩ් - ශ්‍රාම් (3) ඇරිස්ටෝටල්
(4) චාල්ස් ඔස්ගුඩ් (5) ෂැනොන් - වීවර්

02. කේත උපයෝගී කරගනිමින් ඒවා සන්දේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ කෙසේ ද?
(1) ප්‍රතිපෝෂණය (2) විකේතකරණය
(3) ආකේතකරණය (4) අභිසරණය
(5) සංකේතකරණය

03. නිර්වාචික සන්නිවේදනය කලාත්මකව සහ ප්‍රබලව යොදා ගත හැකි මාධ්‍ය වන්නේ,
(1) සිනමාවයි. (2) රූපවාහිනියයි. (3) ගුවන්විදුලියයි.
(4) අන්තර්ජාලයයි. (5) නව මාධ්‍යයයි.

04. මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත **නොහැකි** සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) වාචික සන්නිවේදනයයි. (2) විධිමත් සන්නිවේදනයයි.
(3) අවිධිමත් සන්නිවේදනයයි. (4) නිර්වාචික සන්නිවේදනයයි.
(5) කථන සන්නිවේදනයයි.

05. ගණිත ආචාර්යවරයා කළුලැල්ලේ ලියූ අංක කිහිපයක් අපැහැදිලි වීම නිසා කමල් සිය පොතෙහි ලියාගත් අංක සාවද්‍ය විය. එබැවින් පිළිතුරු ද අසාර්ථක විය. මෙය සන්නිවේදනයේ විග්‍රහය අනුව,
(1) ග්‍රාහක දෝෂයකි. (2) බාධක තත්ත්වයකි.
(3) සාවද්‍ය චින්තනයකි. (4) පරිකල්පන ගැටලුවකි.
(5) අනවබෝධයකි.

06. වෙරළබඩ ගම්මානයක ජනතාවට සුනාමි අනතුරක දී ඉතා ඉක්මනින් හා පුළුල් ලෙස අනතුරු ඇඟවීමක් කළ හැකි වන්නේ,
(1) ලිඛිත සන්නිවේදනයෙනි. (2) දෘශ්‍ය සන්නිවේදනයෙනි.
(3) ශ්‍රව්‍ය සන්නිවේදනයෙනි. (4) ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදනයෙනි.
(5) ලිඛිත හා දෘශ්‍ය සන්නිවේදනයෙනි.

07. ජන සන්නිවේදනය, සෙසු සන්නිවේදන වර්ග අතුරෙන් වෙනස් වීමට හේතු වන්නේ එහි ක්‍රියාවලියේ දෘෂ්‍යමාන
(1) කර්මාන්තමය ස්වභාවයයි. (2) සමජාතීය ග්‍රාහක ක්ෂේත්‍රයයි.
(3) සන්නිවේදක-ග්‍රාහක සමීපතාවයි. (4) සක්‍රීය ප්‍රතිපෝෂණයයි.
(5) අසන්තතික බවයි.

08. පාසල් ක්‍රීඩා පිටියේ දී ක්ලාන්ත වූ සිසුවෙකුට ප්‍රථමාධාර ලබාදුන් ශිෂ්‍ය නායකයෙකු සඳහන් කළේ තමා කියවා තිබූ පොත් හා ප්‍රථමාධාර දෙන ආකාරය නිරීක්ෂණය කර තිබීම ඒ සඳහා උපකාරී වූ බවකි. මෙම කරුණ අයත් වන සන්නිවේදන මූලිකාංගය වන්නේ,
(1) ආකේතකරණයයි. (2) විකේතකරණයයි. (3) ප්‍රතිපෝෂණයයි.
(4) අත්දැකීම් පසුතලයයි. (5) සන්දේශ ග්‍රහණයයි.

09. ''මහජන සම්බන්ධතාව'' යනු කුමක් ද? මැයෙන් පවත්වන දේශනයක ඇතුළත් වීමට **අවම** ඉඩක් ඇති ප්‍රකාශනය වන්නේ,
(1) කීර්තිය පිළිබඳ අවධානය යොමු කරන්නකි.
(2) මත ගොඩනැගීම හා සම්බන්ධ වූවකි.
(3) සැලසුම් සහගතව සිදු කරන කාර්යයකි.
(4) හොඳ හිත ආරක්ෂා කිරීමට අදාළ වූවකි.
(5) නිශ්චිත අවස්ථාවල දී සිදු කරනු ලබන්නකි.

10. දුරකථන සන්නිවේදනයක දී දෙපාර්ශ්වයට ම වැටහෙන පරිදි යොදා ගත හැකි නිර්වාචික සන්නිවේදන ක්‍රම ඇතුළත් වරණය කුමක් ද?
   (1) කථන වේගය, නිහඬතාව, ගන්ධය, රිද්මය
   (2) නිහඬතාව, ඉඟිය, රිද්මය, අවකාශය
   (3) නිහඬතාව, කථන වේගය, රිද්මය, හඬ රටා
   (4) කථන වේගය, තාරතාව, ගන්ධය, රිද්මය
   (5) අවකාශය, ඉරියව්ව, කටහඬ, රිද්මය

11. පරිසරයේ විවිධ ජීවී අජීවී ශබ්ද එකිනෙකින් වෙන්කර හඳුනාගැනීමට සමත් වීම,
   (1) පරිසරය තේරුම් ගැනීමට උපකාරී වන්නකි.
   (2) ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට හේතු වන්නකි.
   (3) සතුන්ගේ හඬ අනුකරණයට අවස්ථා නිර්මාණය කරන්නකි.
   (4) ශ්‍රවණේන්ද්‍රියේ ක්‍රියාකාරිත්වය හඳුනාගැනීමට ඉවහල් වන්නකි.
   (5) අව්ධිමත් සන්නිවේදනය ප්‍රගුණ කිරීමට හේතු වන්නකි.

12. සාම්ප්‍රදායික සන්නිවේදන විධික්‍රමයක් ලෙස ගැමි නාටක පිළිබඳ කියවෙන **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
   (1) අදෘශ්‍යමාන වස්තූන් ඇමතීම හා ඒවායෙන් පිහිටක් ලබා ගනියි.
   (2) ගැමි නාටක සඳහා කිසියම් කථා පුවතක් පදනම් කරගනියි.
   (3) ප්‍රදේශ අනුව ගැමි නාටකවල විවිධතා පවතී.
   (4) කවි කීම, හිටිවන සංවාද උපයෝගී කර ගනියි.
   (5) රංගයට අදාළ භාණ්ඩ පරිසරයෙන්ම සපයා ගනියි.

13. මාධ්‍ය නියාමනය සෘජුව සිදු කළ හැක්කේ,
   (1) ජනමාධ්‍ය ආචාරධර්මවලිනි.
   (2) සාම්ප්‍රදායික ක්‍රමවලිනි.
   (3) නිදහස් මතවාදයෙනි.
   (4) නෛතික විධික්‍රමවලිනි.
   (5) මාධ්‍ය සම්මුතිවලිනි.

14. නූතන ජනමාධ්‍යවල **අවම** වශයෙන් දක්නට ලැබෙන ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ,
   (1) ජනවහර භාවිතයට ගැනීමයි.
   (2) සංවිධානගත බවින් යුක්ත වීමයි.
   (3) වැඩි පෙළඹවීමකින් යුක්ත වීමයි.
   (4) උත්තේජනය ප්‍රයෝජනයට ගැනීමයි.
   (5) පුද්ගල විභින්නතාව හඳුනා ගැනීමයි.

15. සංස්කෘතිය යනු,
   A - මානව අත්දැකීම්, පුරුදු හා හැකියා ඇතුළු සමස්තයයි.
   B - ජනමාධ්‍ය මඟින් උගන්වනු ලබන ඇගයුම් සමූහයයි.
   C - සමාජය එකට බැඳ තබන වටිනාකම්වලින් සමන්විත වූවකි.
   D - මානව සබඳතා මත බිහි වී වර්ධනය වූවකි.

   ඉහත කරුණුවලින් නිවැරදි වන්නේ,
   (1) A, B හා C පමණි.
   (2) A, B හා D පමණි.
   (3) A, C හා D පමණි.
   .(4) B, A හා D පමණි.
   (5) B, C හා D පමණි

16. නිර්මාණයකට වස්තු විෂය උකහා ගන්නා මූලික ක්‍රමවේද ත්‍රිත්වය වන්නේ,
   (1) ප්‍රජානනය, ප්‍රතිසංවේදනය හා ප්‍රත්‍යක්ෂණයයි.
   (2) තමාගේ, අන්‍යයන්ගේ හා මාධ්‍ය ආශ්‍රිත අත්දැකීම්යි.
   (3) ආත්ම භාෂණය, පරිකල්පනය හා ව්‍යුත්පත්තියයි.
   (4) සංවේදනය, ප්‍රත්‍යක්ෂණය හා සතතාභ්‍යාසයයි.
   (5) ස්ව අත්දැකීම්, පරිකල්පනීය අත්දැකීම් හා සමාජානුයෝජනයයි.

17. ජනප්‍රිය සංස්කෘතිය තුළ ජනමාධ්‍ය වඩාත් ඉස්මතු කර දක්වන්නේ,
   (1) වෙළෙඳ ප්‍රතිලාභ මතුකර ජනාකර්ෂණය දිනා ගත හැකි සන්දේශයන් ය.
   (2) බහුතර සංස්කෘතික නියෝජනය සහිත සන්දේශයන් ය.
   (3) ග්‍රාහකයාගේ ඥානය ප්‍රවර්ධනය කරන සන්දේශයන් ය.
   (4) ග්‍රාහකයා විසින් ඉල්ලා සිටින අන්තර්ගතයන් සහිත සන්දේශයන් ය.
   (5) ජන සමාජයේ ජනප්‍රිය වී ඇති සංස්කෘතික අංග පාදක සන්දේශයන් ය.

18. ප්‍රස්ථාව පිරුළු සම්බන්ධයෙන් වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
   (1) අදහස් කෙටියෙන් හා ප්‍රබලව ප්‍රකාශ කිරීමේ දී යොදා ගත හැකි ය.
   (2) එදිනෙදා සන්නිවේදන කටයුතුවලට යොදා ගැනීම අපහසු වේ.
   (3) ගුප්ත හා අදෘශ්‍යමාන බලවේගවලට සම්බන්ධව නිර්මාණය වූවකි.
   (4) ජනකතා සමග සම්බන්ධතාවක් නොමැත.
   (5) නව සමාජ සංසිද්ධිවලට අනුව අලුතින් නිර්මාණය නොවේ.

19. මාධ්‍ය භාෂා භාවිතය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   (1) මාධ්‍යයක භාවිත භාෂාව මගින් ග්‍රාහක ස්ථානයේ භාවාත්මක පදනම වර්ධනය කළ හැකි ය.
   (2) ඇතැම් විටෙක මාධ්‍යයන්හි භාවිත භාෂාව මගින් ග්‍රාහකයන් අතරමං කරනු ලබයි.
   (3) දෘශ්‍ය මාධ්‍ය අපේක්ෂිත බලපෑම ඇති කිරීම සඳහා භාෂාව බහුලව භාවිත කරයි.
   (4) නව මාධ්‍යයන්හි භාවිත භාෂාව මුද්‍රිත මාධ්‍ය භාෂාව තරම් ප්‍රමිති ගුණයෙන් යුක්ත නොවේ.
   (5) ගුවන්විදුලි මාධ්‍ය තුළ විස්තරාත්මක වැකිවලින් වැළකීම යෝග්‍ය වේ.

20. අප රටේ මෑතක දී ඇති වූ වසංගත රෝග අවස්ථාවේ දී ජනතාව වෙත සහනාධාර එක්රැස් කර බෙදා දීමට ජනමාධ්‍ය ආයතන විසින් කටයුතු කරන ලදී. ආයතනික දෘෂ්ටි කෝණයෙන් බලන විට මෙය,
   (1) ජනමාධ්‍යයේ එක් ප්‍රමුඛ කාර්යයකි.
   (2) ආපදා කළමනාකරණ ක්‍රියාවලියකි.
   (3) ප්‍රජා සත්කාරයකි.
   (4) මහජන සම්බන්ධතා ස්වරූපයකි.
   (5) මාධ්‍ය සමාජ වගකීම් ඉටු කිරීමකි.

21. මාධ්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A - මාධ්‍ය සාක්ෂරතාවෙහි පදනම ලිවීමට හා කියවීමට ඇති හැකියාවයි.
   B - මාධ්‍ය සාක්ෂරතාව වැඩිපුර අදාළ වන්නේ මුද්‍රිත මාධ්‍ය සම්බන්ධයෙනි.
   C - මාධ්‍ය අන්තර්ගතය තේරුම් ගෙන පරිහරණය කිරීම මාධ්‍ය සාක්ෂරතාවයි.
   D - සන්දේශ නිර්මාණය හා ඇගයීම මාධ්‍ය සාක්ෂරතාවෙහි අංගයක් වේ.
   ඉහත ප්‍රකාශ අතුරෙන්,
   (1) A පමණක් සත්‍ය වේ.
   (2) B පමණක් සත්‍ය වේ.
   (3) C පමණක් සත්‍ය වේ.
   (4) A හා B පමණක් සත්‍ය වේ.
   (5) C හා D පමණක් සත්‍ය වේ.

22. ජනශ්‍රැති හැදෑරීම සෑම නිර්මාණකරුවෙකුට ම වැදගත් වන බව විචාරකයෝ පෙන්වා දෙති. එයට හේතුව වන්නේ,
   (1) ජනශ්‍රැතිවලින් ජන විඥානය හඳුනාගත හැකි වන නිසා ය.
   (2) ජනශ්‍රැති ප්‍රාථමික මූලාශ්‍රය වන නිසා ය.
   (3) ජනශ්‍රැති නිර්මාණශීලී වන නිසා ය.
   (4) ජනශ්‍රැතිවලින් වස්තු බීජ සොයාගත හැකි වන නිසා ය.
   (5) ජනශ්‍රැතිවල ජනවහර පවතින නිසා ය.

23. මාධ්‍ය කර්මාන්තය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
   (1) වඩාත් සංවිධානාත්මක ව්‍යූහයක් තුළ ක්‍රියාත්මක වීම
   (2) වෙළෙඳපොළ අවශ්‍යතා මුල් කර ගනිමින් කටයුතු කිරීම
   (3) පාර්ශ්ව ගණනාවක් එකතු ව සන්දේශ නිෂ්පාදනය කිරීම
   (4) මාධ්‍ය ආයතන අතර තරගකාරීත්වයක් පැවතීම
   (5) සැමවිට ම සමාජීය මනස ව්‍යාපාරික ආධිපත්‍යයෙන් ගළවා ගැනීම

24. චිත්‍රපටයක එන දර්ශනාවලියක පළමු රූපයෙන් පුද්ගලයෙකුගේ මිය යෑම නිරූපණය කෙරේ. දෙවන රූපයෙන් ගං තෙරක සිටින කුරුල්ලන් පියඹා යන දර්ශනයක් වෙත ඍජුව ම ඡේදනය වේ.
   මෙය නැරඹූ පියල්ට කිසිවක් වැටහී නොගිය බව පැවසී ය. ඒ සඳහා හේතු වන්නට ඇත්තේ,
   (1) පියල්ට චිත්‍රපටයේ සංඥාර්ථ නිසි ලෙස කියවා ගැනීමට නොහැකි වීමයි.
   (2) පියල්ට චිත්‍රපට මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීමයි.
   (3) පියල් සිටි ස්ථානයට චිත්‍රපටය මැනවින් දර්ශනය නොවීමයි.
   (4) පියල්ට සාක්ෂරතා ඥානය නොමැති වීමයි.
   (5) පියල්ට එම චිත්‍රපටයේ රූප අපැහැදිලි වීමයි.

25. මාධ්‍ය හා ගෝලීයකරණය පිළිබඳ ව පාසල් මාධ්‍ය සමාජයක පවත්වන ලද සාකච්ඡාවක දී උසස් පෙළ සිසුන් කිහිපදෙනෙකු ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

මධූෂි :- ගෝලීයකරණයේ ව්‍යාප්තියට මාධ්‍ය පිටිවහලක් වුනා

රේණුකා :- වාණිජ කර්මාන්තයේ කාලීන අවශ්‍යතාවක් ලෙස මාධ්‍ය සංස්කෘතිය හඳුන්වන්න පුළුවන්

මේනකා :- ජනමාධ්‍ය සංස්කෘතියෙන් සංතෘප්ත කරන ජනතාවට එහි බලපෑම ගැන දැනුවත්කමක් නැහැ

ප්‍රබෝධනී :- මාධ්‍ය සිය වෙළෙඳපොළ ව්‍යාප්ත කිරීම සඳහා සාම්ප්‍රදායික අදහස් උපයෝගී කර ගන්නේ නැහැ

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) මධූෂි, රේණුකා හා මේනකාගේ ය.
(2) රේණුකා, මේනකා හා ප්‍රබෝධනීගේ ය.
(3) මධූෂි, මේනකා හා ප්‍රබෝධනීගේ ය.
(4) මධූෂි, රේණුකා හා ප්‍රබෝධනීගේ ය.
(5) මධූෂි, රේණුකා, මේනකා හා ප්‍රබෝධනී යන සියලු දෙනාගේ ම ය.

## B කොටස

26. ලේඛකයා නවකතාවක චරිත අතර සිදු වන සංවේදී පසුබිම් පරිසරය පිළිබඳ ඉදිරිපත් කරන විස්තර කිරීම

(1) වාර්තාකරණයකි.
(2) රූපණයකි.
(3) විවරණයකි.
(4) භාෂණයකි.
(5) විවේචනයකි.

27. පහත සඳහන් යුගලවලින් සංකල්පීය ලෙස **ප්‍රතිවිරුද්ධ** වන්නේ,

(1) අධිපතිවාදී සංකල්පය සහ කොමියුනිස්ට්වාදී සංකල්පයයි.
(2) නිදහස් මතවාදී සංකල්පය සහ බටහිර මතවාදී සංකල්පයයි.
(3) අධිපතිවාදී සංකල්පය සහ නිදහස් මතවාදී සංකල්පයයි.
(4) කොමියුනිස්ට්වාදී සංකල්පය සහ විප්ලවවාදී සංකල්පයයි.
(5) ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය සහ සංවර්ධනාත්මක සංකල්පයයි.

28. විකල්ප මාධ්‍ය සම්බන්ධ වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,

(1) ජනප්‍රිය සංස්කෘතිය සමග සමීප සබඳතාවක් පැවැත්වීමයි.
(2) ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය සමග තරග කිරීමයි.
(3) සමාජයේ විශාල පිරිසක් වෙත ගමන් කිරීමයි.
(4) මතවාදී කාර්යයට ප්‍රමුඛ තැනක් ලබා දීමයි.
(5) උසස් මාධ්‍ය තාක්ෂණයක් පවත්වාගෙන යාමයි.

29. භාෂා භාවිතය පිළිබඳ කරුණු කිහිපයක් පහතින් දැක්වේ.

A - ආත්ම ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ හැකියාව
B - පුද්ගල බද්ධ සංසිද්ධියක් වීම
C - පෞද්ගලික දෘෂ්ටිකෝණයක් අවශ්‍ය වීම

ඉහත කරුණු අනුරූප භාෂා භාවිත ප්‍රභේද අනුපිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) භාෂණය, විවරණය, ලේඛනය
(2) රූපණය, ලේඛනය, විවරණය
(3) කථනය, රූපණය, භාෂණය
(4) භාෂණය, රූපණය, විවරණය
(5) ලේඛනය, භාෂණය, කථනය

30. සමකාලීන මාධ්‍ය සංස්කෘතිය තුළ අභිසාරී මාධ්‍ය ප්‍රවණතාව වර්ධනය වන්නේ,

(1) ජනමාධ්‍ය නාලිකාවල ප්‍රමාණාත්මක වර්ධනය නිසා ය.
(2) ජංගම දුරකථන මගින් ග්‍රාහක අන්තර් ක්‍රියාකාරිත්වය වර්ධනය වීම නිසා ය.
(3) අන්තර්ජාලයේ ව්‍යාප්තිය නිසා ය.
(4) සන්නිවේදනයේ දෘශ්‍ය ප්‍රවණතාව වර්ධනය වීම නිසා ය.
(5) ගෝලීයකරණයේ ඇඩි බලපෑම නිසා ය.


31. දැනට ක්‍රියාත්මක තොරතුරු අයිතිය පිළිබඳ නීතිය භාවිත කළ හැක්කේ,
(1) ජනමාධ්‍යවේදීන්ට තොරතුරු ලබා ගැනීම සඳහා පමණි.
(2) රාජ්‍ය හා පෞද්ගලික අංශවල තොරතුරු ලබා ගැනීම සඳහා ය.
(3) රාජ්‍ය හා ඊට සම්බන්ධ ආයතන මගින් සිදු කරන කටයුතුවලට අදාළ තොරතුරු දැනගැනීමට ය.
(4) වසර 10කට පෙර හුවමාරු වූ රාජ්‍ය ලිපිලේඛන පරීක්ෂා කිරීමට ය.
(5) රාජ්‍ය අංශයට අයත් ඕනෑම තොරතුරක් වහාම ලබා ගැනීම සඳහා ය.

32. සංවර්ධන සන්නිවේදන විධික්‍රම තීරණය කිරීමේ දී සලකා බැලීමට යෝජිත අදහස් කිහිපයක් පහත දැක්වේ.
A - නවීන තාක්ෂණික සංවර්ධනය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කළ හැකි ය.
B - සැලසුම් සම්පාදනය කළ යුත්තේ අදාළ කාර්යය පිළිබඳ විශේෂඥයන් විසිනි.
C - සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම සමග මිශ්‍රව යොදා ගැනීමේ හැකියාව විමසා බැලීම සුදුසු ය.
D - ඉලක්ක ප්‍රජාව පමණක් අරමුණු කරගත් සැලසුම් සහගත සන්නිවේදනයක් විය යුතු ය.
E - භාෂාව ඵලදායි ලෙස භාවිත කිරීමේ හැකියාව විමසා බලා තෝරාගත යුතු ය.
ඉහත අදහස් අතුරෙන් සත්‍ය වන්නේ,
(1) A, B, C හා D පමණි.
(2) A, B, D හා E පමණි.
(3) A, C, D හා E පමණි.
(4) B, C, D හා E පමණි.
(5) A, B, C, D හා E යන සියල්ල ම ය.

33. රාජ්‍ය මාධ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය මැයි දින රැස්වීම් පිළිබඳ වාර්තා කර තිබුණේ එකිනෙකට වෙනස් ආකාරයෙනි. මෙම තත්ත්වය හොඳින් තේරුම් ගැනීමට වඩාත් වැදගත් වන්නේ,
(1) මාධ්‍ය හිමිකාරීත්වය පිළිබඳ විචාරාත්මක අවබෝධයයි.
(2) මාධ්‍ය වාර්තාකරණය පිළිබඳ යාවත්කාලීන දැනුමයි.
(3) මාධ්‍ය දේශපාලනය පිළිබඳ යථාර්ථවාදී දෘෂ්ටියයි.
(4) මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ ප්‍රායෝගික කුසලතාවයි.
(5) මාධ්‍ය ස්වාධීනත්වය පිළිබඳ න්‍යායාත්මක පරිචයයි.

34. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) මැතිවරණ ව්‍යාපාරවලදී ජනතා න්‍යාය පත්‍රය සකස් කරන්නේ ජනමාධ්‍යයයි.
(2) සහවේදනය මනාව තේරුම් ගැනීමට නම් අනුකම්පාව හා සැසඳිය යුතු ය.
(3) වාචික සන්නිවේදනය තුළ අවාචික ලක්ෂණ ද පවතියි.
(4) ජනමාධ්‍ය මගින් සමාජ යථාර්ථය නිසි ලෙස පිළිබිඹු වේ.
(5) භාෂාවක ශබ්ද හා අර්ථ අතර තර්කානුකූල සම්බන්ධතාවක් නැත.

- පහත දැක්වෙන්නේ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය යැයි උපකල්පනය කරන්න. මෙම ආකෘතිය ඇසුරින් ප්‍රශ්න අංක 35 - 38 දක්වා පිළිතුරු සපයන්න.




35. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියේ අන්තර්ගත මූලික අංගවලින් එක් අංගයක් ඉවත් කළ විට එය බර්ලෝ සන්නිවේදන ආකෘතියෙහි අන්තර්ගත අංග හා සමාන බවක් දක්වයි. එසේ සමාන වීමට ඉහත ආකෘතියේ අංග අතුරෙන් ඉවත් කළ යුත්තේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය.

36. බර්ලෝගේ සන්නිවේදන ආකෘතියේදී අන්තර්ගත එක් එක් මූලිකාංගය හා බැඳුණු ප්‍රධාන ලක්ෂණ පහ බැගින් ඉදිරිපත් කරයි. ඉහත ප්‍රශ්නයේ පිළිතුරට අදාළ අංගය ඉවත් කළ පසු ඉතිරි අංග හතර බර්ලෝ සන්නිවේදන ආකෘතිය සමග සැසඳේ නම් එකී අංග හතර අතුරෙන් සමාන ලක්ෂණ දැකිය හැකි අංග දෙක වන්නේ,
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය. (5) C හා E ය.

37. ඉහත ආකෘතියට ප්‍රතිපෝෂණය ඇතුළත් කළහොත් එහිදී පණිවිඩය ගමන් කරනුයේ,
(1) A සිට D දක්වා ය. (2) A සිට E දක්වා ය. (3) B සිට A දක්වා ය.
(4) D සිට A දක්වා ය. (5) E සිට A දක්වා ය.

38. ඉහත ආකෘතිය ජන සන්නිවේදන අවස්ථාවක් හා ගැළපීමේදී පුවත්පත අදාළ වන අංගය වනුයේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය.

39. නිර්මාණකරණයට අදාළ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - පුද්ගල අනුභූතීන් බෙදා හදා ගැනීම
B - සාක්ෂරතා ඥානය පැවතීම
C - සන්දේශයෙහි මතුපිට අර්ථය
D - ශිල්පීය විවිධතා ගැන අවබෝධය
මේවා අතුරෙන් 'නිර්මාණශීලී කියවීම' හා සම්බන්ධ වන්නේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) A, B හා C පමණි. (5) A, B හා D පමණි.

40. ජනතා බැංකුවේ මුදල් තැන්පත් කර ඇති තැන්පත්කරුවන්ගේ පෞද්ගලික තොරතුරු, ප්‍රවෘත්ති වෙබ් අඩවියක් මගින් ප්‍රසිද්ධ කර තිබුණි. එමගින් බැංකුවේ ප්‍රතිරූපය බිඳ වැටුණු බැවින් කරුණු පැහැදිලි කිරීමේ මාධ්‍ය සාකච්ඡාවක් කැඳවන ලදී. එවැනි අවස්ථාවකදී බැංකුවේ නිලධාරීන් වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
(1) පැමිණෙන මාධ්‍යවේදීන්ට හොඳ සංග්‍රහයක් සූදානම් කිරීමටයි.
(2) වටිනා ත්‍යාගයක් මාධ්‍යවේදීන්ට සිහිවටනයක් ලෙස පිරිනැමීමටයි.
(3) බැංකුවේ පැරණි වාර්ෂික වාර්තා පිටපත් මාධ්‍යවේදීන්ට ලබා දීමටයි.
(4) බැංකුව සිදු කරන ලද ප්‍රජා සේවා වැඩසටහන් විස්තර කිරීමටයි.
(5) ඉදිරිපත් විය හැකි ප්‍රශ්නවලට පිළිතුරු සූදානම් කර ගැනීමටයි.

41. පහත දැක්වෙන්නේ ස්ව සංකල්පය පිළිබඳ සාකච්ඡාවකදී සිසුන් දැක්වූ ප්‍රකාශ කිහිපයකි.
රුවන් :- ස්ව සංකල්පය යනු යම් පුද්ගලයකු තමන්ව අන් පුද්ගලයන්ට දක්නට සලස්වන ආකාරයයි.
රාම් :- එය මැනීමට නොහැකි ය.
රහීම් :- උප්පත්තියෙන්ම පැමිණෙන්නකි.
රොජර් :- කාලාන්තරයක් තුළ වෙනස් විය හැකි ය.
ස්ව සංකල්පය පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ,
(1) රහීම් සහ රාම් ය.
(2) රුවන් සහ රහීම් ය.
(3) රුවන් සහ රොජර් ය.
(4) රාම් සහ රොජර් ය.
(5) රුවන්, රාම්, රහීම් සහ රොජර් ය.

42. ලොව විවිධ රටවල මාධ්‍ය හිමිකාරිත්වයේ ස්වභාවය පිළිබඳ පන්තියේදී ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පහත දැක්වේ. ඒවා අතුරින් බහුලව දක්නට ලැබෙන තත්ත්වය කුමක් ද?
(1) පාලනය රජයේ ඒකාධිකාරයක් ලෙස පවතී.
(2) පෞද්ගලික අංශය සතු වන අතර පාලනය රජය මගින් සිදු වේ.
(3) පෞද්ගලික අංශය සතු වුවත් රාජ්‍ය පාලනයෙන් නිදහස් වේ.
(4) මාධ්‍ය හිමිකාරිත්වය සහ පාලනය යන දෙඅංශයම රාජ්‍ය පාලනයෙන් නිදහස් වේ.
(5) හිමිකාරිත්වය සහ පාලනය රජය සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් සිදු වේ.

43. ප්‍රාථමික පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් පාසල් සංවර්ධන සමිතිය මගින් ආරම්භ කරන ලදී. එහි කාර්ය සාධනය ව්‍යාපෘති කළමනාකරණ පත්‍රිකාවක් ඇසුරෙන් විමසා බැලීමට තීරණය විය. ව්‍යාපෘති කළමනාකරණ පත්‍රිකාවක ඇතුළත් විය යුතු මූලික කරුණු කිහිපයක් වන්නේ,
(1) අරමුණු, අයවැය, සංවිධාන ව්‍යුහය හා සීමා ය.
(2) අදාළ කාර්යයන්, කාල රාමුව, නිර්ණායක හා වගකීම් ය.
(3) මූල්‍ය සම්පත්, භෞතික සම්පත්, මානව සම්පත් හා ඇගයුම් ක්‍රියාවලිය ය.
(4) අයවැය, උපායමාර්ග, කාර්ය පථය හා අපේක්ෂිත ප්‍රතිඵල ය.
(5) අරමුණු, උපායමාර්ග, සම්පත් හා කාල රාමුව ය.

44. නීතිය හා සාමය පවත්වාගෙන යාමේ අරමුණින් රටක සමාජ මාධ්‍ය වාරණය කරනු ලබන්නේ එම මාධ්‍යයේ සන්දේශ,
(1) ඉතා වේගවත්ව ග්‍රාහකයන් අතර පැතිර යන බැවිනි.
(2) විශ්වසනීයත්වයෙන් ඉහළ මට්ටමක පවතින බැවිනි.
(3) විශ්ලේෂණාත්මක ලෙස කරුණු ඉදිරිපත් වන බැවිනි.
(4) රූප හා හඬ කොටස් අවම ලෙස භාවිත වන බැවිනි.
(5) නිල මූලාශ්‍ර මත පමණක් තොරතුරු ඉදිරිපත් කරන බැවිනි.

45. 'ග්‍රාහක කේන්ද්‍රීය සන්දේශකරණය' යනුවෙන් අදහස් කරන්නේ,
(1) ග්‍රාහකයාට සන්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමයි.
(2) ග්‍රාහකයාට ගැළපෙන ලෙස සන්දේශ සකස් කිරීමයි.
(3) ග්‍රාහකයා වෙත සන්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිබඳව විමසා බැලීමයි.
(4) සන්දේශකරණයේදී සන්නිවේදකයාගේ අනන්‍යතාව නොසලකා හැරීමයි.
(5) ග්‍රාහකයින්ගේ සමාජ, සංස්කෘතික පසුබිම පිළිබඳ අවධානයෙන් තොරව සන්දේශ සකස් කිරීමයි.

46. පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - සංවර්ධනයේ පදනම ජනමාධ්‍ය බැවින් ඒවා සැලසුම් සහගත ව භාවිත කළ යුතු ය.
B - සමාජයේ සෑම ඓතිහාසික වෙනස්වීමක් ම පන්ති අරගලයේ බලපෑමට හසු වී ඇත.
C - කාර්මික සංවර්ධනය සමග කම්කරු ශ්‍රමික පන්තියක් බිහි විය.
D - නව ව්‍යාපාරික පන්තිය ගොවි කම්කරු ජනතාව පීඩාවට පත් කරයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් සමාජ විග්‍රහය පිළිබඳ මාක්ස්වාදී ප්‍රවේශයට අනුව නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) A, B හා C පමණි (5) B, C හා D පමණි.

47. සිය ඉල්ලීම් දිනා ගැනීම සඳහා දිගු කාලයක් ඉල්ලීම් කර එය අසාර්ථක වූ පසු පුද්ගලයෙකු ඊට විරෝධය පෑම සඳහා ප්‍රසිද්ධියේ රජයේ ගොඩනැගිල්ලක වහලය මත මාරාන්තික උපවාසයක් ආරම්භ කරන බවට රූපවාහිනි මාධ්‍යවේදියෙකුට දැනගන්නට ලැබිණ. සමාජ හිතකාමී පුවත් සෙවීම තම වගකීම කර ගත් මාධ්‍යවේදියකු ලෙස ඔහු/ඇය මෙහි දී කළ යුතුව තිබුණේ කුමක් ද?
(1) අදාළ පුද්ගලයා පිළිබඳ ව පොලිසියට දැනුම් දී සිද්ධියට පෙර ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම.
(2) මාරාන්තික උපවාසයට තැත් කිරීමේ උත්සාහය වළකාලමින් ඔහුගේ ඉල්ලීම් සඳහා මාධ්‍ය මගින් හඬක් නිර්මාණය කිරීම.
(3) සිදුවීම උපරිම ලෙස ආවරණය කර වහා මාධ්‍ය වෙත උණුසුම් පුවත් ලබා දීමට අදහස් කිරීම.
(4) වෙනත් මාධ්‍ය ආයතන වාර්තාකරුවන් උපක්‍රමික ව වළක්වා වාර්තාකරණයේ ප්‍රමුඛයා බවට පත්වීමට කටයුතු කිරීම.
(5) බලධාරීන් කළ වරද ඉස්මතු කිරීම සඳහා මාරාන්තික උපවාසයේ යෙදීමට තැත් කළ පුද්ගලයාගේ ප්‍රකාශනයක් රූගත කර ගැනීමට උනන්දු වීම.

48. රූපවාහිනි වෙළෙඳ දැන්වීම් පිළිබඳ සාකච්ඡාවක් පාසල් මාධ්‍ය කවයේ දී මතු විය.
ජයනි :- භාණ්ඩ පරිභෝජන රටාව වෙනස් කරන්න දැන්වීම්වලට පුළුවන්.
නයනි :- දැන්වීම්වලින් තොරව ජනමාධ්‍යවලට පවතින්න අපහසුයි.
රුවනි :- විශ්වසනීයත්වයකින් යුතුව භාණ්ඩ මිල දී ගැනීමට දැන්වීම් ප්‍රයෝජනවත්.
කමනි :- වෙළෙඳ දැන්වීම් නිවැරදිව වටහා ගන්න මාධ්‍ය සාක්ෂරතාව තිබිය යුතුයි.
ඉහත ප්‍රකාශ අතුරින් වෙළෙඳ දැන්වීම් පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ,
(1) ජයනි හා රුවනි පමණි.
(2) ජයනි, නයනි සහ රුවනි පමණි.
(3) නයනි, රුවනි සහ කමනි පමණි.
(4) ජයනි, නයනි සහ කමනි පමණි.
(5) ජයනි, නයනි, රුවනි සහ කමනි යන සියලු දෙනාම ය.

49. විමල් සිය රැකියාවෙන් විශ්‍රාම ගැනීම නිසා සුපුරුදු ජීවන රටාවෙන් බැහැර වීමට ඔහුට සිදු විය. අනපේක්ෂිත ජීවන වෙනස්කම් හේතුවෙන් ඔහු මානසික දුර්වල තත්ත්වයට ද පත් විය. මෙය,
(1) ආතතියේ ලක්ෂණයකි. (2) ක්ලමථයේ ලක්ෂණයකි.
(3) කාංසාවේ ලක්ෂණයකි. (4) විශාදයේ ලක්ෂණයකි.
(5) ධ්‍රැවගත වීමේ ලක්ෂණයකි.

50. මාධ්‍ය විචාරකයාගේ කාර්යභාරය කුමක් ද යන්න සම්බන්ධයෙන් පන්ති කාමරය තුළ සාකච්ඡාවක් මතු විය.

නිමල් :- විචාරකයාට මාධ්‍යයේ වෘත්තීමය ස්වභාවය පිළිබඳ අවබෝධයක් තිබෙන්න ඕන.

කමල් :- සාමාන්‍ය ග්‍රාහකයාට වඩා විමර්ශනාත්මක හැකියා ඉහළ කෙනෙක් වෙන්නත් ඕන.

විමල් :- ඒ වගේ ම විචාරකයා මාධ්‍ය නිර්මාණ නිර්දය ලෙස විචාරය කරන්නෙක්.

රමල් :- මාධ්‍ය අන්තර්ගතය ගැන අවධානය යොමු කිරීම මිස කර්මාන්තය පවත්වාගෙන යාමට ඔහු දායක නොවිය යුතු ය.

ඉහත අදහස් අතුරෙන් විචාරක භූමිකාව හා ගැළපෙන අදහස් ඉදිරිපත් කරනුයේ,

(1) නිමල් හා කමල් ය.
(2) නිමල් හා විමල් ය.
(3) නිමල්, විමල් හා රමල් ය.
(4) කමල්, විමල් හා රමල් ය.
(5) නිමල්, කමල් හා රමල් ය.

## C කොටස

26. ජනමාධ්‍ය ආයතන ඇතැම් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධාරිත බලයක් යොදයි. මෙය HUB ආකෘතියෙන් පෙන්නුම් කරනුයේ,

(1) පෙරහනු මගිනි.
(2) බලපෑම මගිනි.
(3) මාධ්‍ය විස්තාරණය මගිනි.
(4) ප්‍රතිපෝෂණය මගිනි.
(5) දොරටුපාලක මගිනි.

27. ආයතනයක මාධ්‍ය නිලධාරියාගේ කාර්යභාරයට **අවම** සම්බන්ධතාවක් දක්වන කාර්ය වන්නේ,

(1) ආයතනයේ විමර්ශන කටයුතුවලට පිළිතුරු ලබා දීමයි.
(2) ඇගයීම් වාර්තා සකස් කිරීමයි.
(3) ප්‍රවර්ධන වැඩසටහන් මෙහෙය වීමයි.
(4) මූල්‍ය කළමනාකරණයට උපදෙස් දීමයි.
(5) කීර්තිනාමය පිළිබඳ අවධානයයි.

28. 1934 දී ඇමෙරිකාවේ ස්ථාපනය කරනු ලැබූ ෆෙඩරල් සන්නිවේදන කොමිසමේ (FCC) ප්‍රමුඛත ම අරමුණ වූයේ,

(1) ගුවන්විදුලි හා රූපවාහිනි ආයතන ප්‍රචලිත කිරීම යි.
(2) ගුවන්විදුලි හා රූපවාහිනී වාණිජ අරමුණුවලට මෙහෙය වීම යි.
(3) ජනමාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටලු නියාමනය කිරීම යි.
(4) සංවර්ධිත අරමුණ සඳහා ජනතාව මෙහෙය වීම යි.
(5) ජනමාධ්‍ය ආයතන අතර තරගය අඩු කිරීම යි.

29. මහාචාර්ය පිලිප් කොට්ලර් විසින් ඉදිරිපත් කරන ලද සිද්ධි වර්ගීකරණයට ඇතුළත් **නොවන** සිද්ධිය වන්නේ,

(1) සමාජ හා ජීවන චක්‍ර සිද්ධිය යි.
(2) දේශපාලන සිද්ධිය යි.
(3) අධ්‍යාපනික හා වෘත්තීය සිද්ධිය යි.
(4) ජාත්‍යන්තර සිද්ධිය යි.
(5) ආගමික සිද්ධිය යි.

30. එකම පන්තියක අධ්‍යාපනය ලැබූ මිතුරන් සමූහයක් විභාගය සමත් වීමෙන් පසු ශිෂ්‍යත්ව ලබා විදෙස්ගත වූහ. ඔවුහු නූතන සන්නිවේදන විධික්‍රම උපයෝගි කර ගනිමින් තොරතුරු හුවමාරු කර ගත්හ. එම තොරතුරු හුවමාරුව සිදුවූයේ,

A - යන්ත්‍ර සහායක හා කණ්ඩායම් සන්නිවේදනයෙනි.
B - අතථ්‍ය හා තාක්ෂණික සන්නිවේදනයෙනි.
C - යන්ත්‍ර සහායක හා අතථ්‍ය සන්නිවේදනයෙනි.
D - යන්ත්‍ර සහායක හා තාක්ෂණික සන්නිවේදනයෙනි.

මේ ඇසුරින් සත්‍ය වන්නේ,

(1) A හා B ය.
(2) A හා C ය.
(3) B හා C ය.
(4) C හා D ය.
(5) A, B, C හා D ය.

31. 1982 දී යුනෙස්කෝ සංවිධානය ගෲන්වල්ට් ප්‍රකාශය මගින් මාධ්‍ය අධ්‍යයනය සඳහා නිර්දේශ කරන ලද්දේ,
(1) මාධ්‍ය සාක්ෂරතාව විචාරශීලී ලෙස මාධ්‍ය පරිහරණය හා නිර්මාණශීලී චින්තනය දරුවන් තුළ ඇති කිරීමයි.
(2) ජනමාධ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ ව පුද්ගලයෙකු තුළ අවබෝධය ගොඩ නැංවීමයි.
(3) සන්නිවේදන තාක්ෂණයේ දියුණුව සමාජය වෙත කරන බලපෑමේ ස්වභාවය පිළිබඳ ව දැනුවත් කිරීමයි.
(4) බිඳ වැටුණු මානසික තත්ත්වයන් ඉලක්ක කර ගනිමින් මාධ්‍ය ඔස්සේ සරල විනෝදය සම්පාදනයටයි.
(5) සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියකු නිර්මාණය කිරීමයි.

32. ස්වයං-නියාමන ප්‍රතිපත්ති යටතට ගැනෙන නියාමන ආයතනය කුමක් ද?
(1) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය
(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
(3) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
(4) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
(5) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

33. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) අනුව්‍යවස්ථාව මගින්, සෑම පුද්ගලයෙකුගේ ම
A - තොරතුරු ඇගයීමේ හිමිකම තහවුරු කරයි.
B - භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට හිමිකම තහවුරු කරයි.
C - තොරතුරු ඇරීමේ අයිතිය ප්‍රකාශිතව දක්වයි.
D - ප්‍රකාශන හිමිකම තහවුරු කරයි.
E - මාධ්‍ය නිදහස ප්‍රකාශ වේ.

ඉහත ප්‍රකාශන අතරින්, සත්‍ය වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A, B හා C පමණි. (5) C, D හා E පමණි.

34. පියල් නන්දාට ඉංග්‍රීසි උගන්වන රූපාවලිය ගම්පෙරළිය චිත්‍රපටයේ වැදගත් දර්ශනයකි. පසුබිමේ වාඩි වී ගෙත්තමක් කරන මාතර හාමිනේ ද, පෙරබිමේ මේසය මත සුදු ඇතිරිල්ලක් මත තබා ඇති හක්ගෙඩිය ද ප්‍රබල අර්ථ, සංකේත මතු කරයි.



මෙම රූප රාමුව පිළිබඳ විචාර පාඨ කිහිපයක් පහත දැක්වේ.
A - රූප රාමුවේ සංදර්භය අතීත ගැමි විභූතිය නිරූපණය කරයි.
B - මවකගේ විචක්ෂණශීලී මනස පිළිබඳ දේශීය දැක්ම අධ්‍යක්ෂවරයාගේ රූප ඥානයට හසු වී තිබේ.
C - සුභ එල පිළිබඳ ගැමි විඥානය අධ්‍යක්ෂවරයා රූප රාමුවට මුසුකර තිබේ.
D - රූප රාමුවේ සැකැස්ම නළුවන්ගේ භාව ප්‍රකාශනය උද්දීපනය කරයි.

මෙම පාඨ අතුරින් සත්‍ය වන්නේ,
(1) A පමණි. (2) A හා B පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ල.

35. බස් රථයක ගමන් කරමින් සිටි රවීට අසල අසුනේ සිටි තැනැත්තා අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම මහත් කරදරයක් විය. තම ජංගම දුරකථනයට කන්බණුව (Earphone) සම්බන්ධ කළ රවී ගුවන්විදුලි ගීතයකට සවන් දීමට පටන් ගත්තේ ය. මෙය ජන සන්නිවේදනයේ කවර ප්‍රයෝජනයක් ලෙස සැලකෙන්නේ ද?
(1) ප්‍රජානනය (Cognition)
(2) සමාජානුයෝජනය (Socialization)
(3) සමාජ උපයෝගිතාව (Social Utility)
(4) නිෂ්කර්ෂණය (Withdrawal)
(5) අපසරණය (Diversion)

36. මාධ්‍ය සාක්ෂරතාව ගොඩනැගීම පිළිබඳ තෙවැදෑරුම් සිද්ධාන්ත ඇතුළත් නිවැරදි වරණය කුමක් ද?
(1) ස්වකේන්ද්‍රය, ස්වාභිමානය, ඥාන දර්ශනය
(2) ස්වකේන්ද්‍රය, ඥාන ව්‍යුහය, කුසලතා
(3) ස්වපථය, ස්වාභිමානය, ස්වකේන්ද්‍රය
(4) ස්වකේන්ද්‍රය, ඥාන දර්ශනය, කුසලතා
(5) ඥාන දර්ශනය, ස්වකේන්ද්‍රය, ස්වාභිමානය

- ප්‍රශ්න අංක 37 හා 38 සඳහා පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

සිසු කණ්ඩායමක් විසින් සිදු කළ සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණයක දත්ත සමූහයක් පහත වගුවේ දැක්වේ.

| | අධ්‍යාපනික කටයුතු සඳහා පමණක් **facebook** භාවිත කිරීම | විනෝදාස්වාදය සඳහා පමණක් **facebook** භාවිත කිරීම | අධ්‍යාපන හා විනෝදාස්වාදය සඳහා යන කරුණු දෙකට ම **facebook** භාවිත කිරීම |
|---|---|---|---|
| පිරිමි | 10 | 30 | 10 |
| ගැහැණු | 20 | 30 | 20 |
| එකතුව | 30 | 60 | 30 |

37. ඉහත දත්ත සටහනට අනුව සිසු කණ්ඩායමේ facebook භාවිතයට අදාළ මාතය (Mode), මධ්‍යස්ථය (Median) සහ මධ්‍යන්‍යය (Mean) පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) 60, 30, 40 (2) 60, 40, 30 (3) 40, 60, 30
(4) 30, 60, 40 (5) 30, 20, 15

38. සිසු කණ්ඩායම අධ්‍යාපනය, විනෝදය හා එම කරුණු දෙකම සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීමේ ප්‍රතිශත පිළිවෙළින්,
(1) 30%, 40%, 30% (2) 30%, 60%, 30% (3) 25%, 50%, 25%
(4) 22%, 66%, 22% (5) 20%, 30%, 20%

39. ගුවන්විදුලිය හඬ පදනම් කරගත් මාධ්‍යයකි. එහි මිනිස් හඬ සමග සංකලනය වන සෙසු සාධක වන්නේ,
(1) සංගීතය, සතුන්ගේ ශබ්ද, ශබ්ද ප්‍රයෝග හා නිහඬතාවයි.
(2) සංගීතය, නිහඬතාව, සතුන්ගේ ශබ්ද හා ස්වාභාවික ශබ්දයි.
(3) ස්වාභාවික ශබ්ද, සතුන්ගේ ශබ්ද, ශබ්ද ප්‍රයෝග හා නිහඬතාවයි.
(4) අනුකරණාත්මක ශබ්ද, සංගීතය, නිහඬතාව හා ශබ්ද ප්‍රයෝගයි.
(5) ස්වාභාවික ශබ්ද, ශබ්ද ප්‍රයෝග, සංගීතය හා නිහඬතාවයි.

40. සන්නිවේදන ක්‍රියාදාමයේදී ''නිර්නියාමනය'' පිළිබඳ ගැළපෙන ක්‍රියාමාර්ගය තෝරන්න.
(1) පුවත්පත් මුද්‍රණ කඩදාසි සඳහා බදු පැනවීම
(2) පුවත්පත් ලියාපදිංචිය අනිවාර්ය කිරීම
(3) රූපවාහිනි නාලිකා අතර තරගය අහෝසි කිරීම
(4) ප්‍රවෘත්ති වෙබ් බලපත්‍රය යාවත්කාලීන කිරීම
(5) මාධ්‍ය ආයතනවලට ලාභ ලැබීමට අවස්ථා ලබා දීම

41. පහත සඳහන් A, B, C සහ D සංකල්ප යුගල අධ්‍යයනය කරන්න.

A - (i) විශ්වීය ප්‍රතිපත්ති
(ii) රාජ්‍ය ප්‍රතිපත්ති

B - (i) නවීකරණය
(ii) පරායත්තතාව

C - (i) ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය
(ii) ජනතා කේන්ද්‍රීය ක්‍රියාමාර්ග

D - (i) තිරසාරත්වය
(ii) පාරිසරික සමතුලිතතාව

සංවර්ධනය සඳහා සන්නිවේදනය අර්ථවත් කෙරෙන වඩාත් ගැළපෙන සංකල්ප ද්විත්වය කුමක් ද?
(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා C (5) C හා D

42. රූපවාහිනියේ ටෙලිනාට්‍යයක් විකාශය වීමෙන් පසු කිසියම් ව්‍යාපාරිකයෙකු විසින් එය හොර රහසේ පටිගත කොට විකුණූ බවට හෙළිවිණි. එය දඬුවම් ලබන වරදක් බව පැහැදිලි ලෙස හඳුන්වා ඇත්තේ,
(1) තොරතුරු දැන ගැනීමේ පනත තුළ ය.
(2) බුද්ධිමය දේපළ පනත තුළ ය.
(3) මානව හිමිකම් පනත තුළ ය.
(4) රූපවාහිනී සංස්ථා පනත තුළ ය.
(5) චිත්‍රපට සංස්ථා පනත තුළ ය.

43. ''කටුක පරිසර තත්ත්වයන්ගෙන් යුත් වියළි කලාපයේ පදිංචි කළ මහවැලි ඉඩම්ලාභීන්ට එම බිම් දියුණු කළ හැකි ය.'' යන මතය ප්‍රජා ගුවන්විදුලිය මගින් ජනගත කිරීමෙන් අපේක්ෂා කරනු ලැබුවේ,
(1) යහපත් පරිසරයක් ගොඩ නැගීමට ය.
(2) අස්වැන්න වර්ධනය කිරීමට මඟපෙන්වීමට ය.
(3) මහවැලි ජලය සම්පතක් බව වටහා දීමට ය.
(4) ස්වයං විශ්වාසය ගොඩනැගීමට ය.
(5) සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රචලිත කිරීමට ය.

44. මාර්ගගත දත්ත පද්ධතියක් මගින් විවිධ තොරතුරු මූලයන්ට ප්‍රවේශ වීමට ඇති හැකියාව හඳුන්වන යෙදුම කුමක් ද?
(1) අංකිතකරණය (Digitalisation)
(2) ජාලගතකරණය (Networking)
(3) අන්තර් ක්‍රියාකාරිත්වය (Interactivity)
(4) අධිපාඨනීයත්වය (Hypertexuality)
(5) ස්වයංකරණය (Automation)

45. තමන්ගේ පාසල පිළිබඳ ව නිර්මාණය වන වාර්තා චිත්‍රපටියක් රූපගත කිරීම සඳහා රූපරාමු සැලසුම් කරන ආකාරය ගැන සිසුන් අතර සාකච්ඡාවක දී පහත සඳහන් කරුණු ඉදිරිපත් විය.
A - මුළු පාසලම දිස්වන පරිදි පාසල් ඉදිරි පෙනුම රූපගත කළ යුතු ය.
B - පන්ති කාමරයේ පාඩම් උගන්වන ගුරුවරයාගේ රූපය පන්තිකාමරයේ පසුබිම සහිතව දැක්විය යුතු ය.
C - විදුහල්පතිතුමාගේ ඉදිරිපත් කිරීමේ දී ඔහුගේ මුහුණේ ඉරියව් පැහැදිලි ව දිස්විය යුතු ය.
D - චිත්‍රපටයේ අවසන් දර්ශනයේ පාසලේ ලාංඡනය දැක්විය යුතු ය.

ඉහත රූපගත කිරීමේ දී වඩාත් ම උචිත රූපරාමු අනුපිළිවෙළ කුමක් ද?
(1) දුර රූපය, මධ්‍යම රූපය, අතිදුර රූපය, සමීප රූපය
(2) දුර රූපය, සමීප රූපය, මධ්‍යම රූපය, අතිදුර රූපය
(3) අතිදුර රූපය, මධ්‍යම රූපය, දුර රූපය, සමීප රූපය
(4) ඉතා දුර රූපය, දුර රූපය, අති සමීප රූපය, සමීප රූපය
(5) අතිදුර රූපය, දුර රූපය, සමීප රූප, අති සමීප රූපය

46. ගෝලීය සංස්කෘතිය පිළිබඳ අන්තර්ජාලය ඇසුරින් ලබාගත් තොරතුරු සිසුන් විසින් පන්තියට ඉදිරිපත් කරනු ලැබී ය.
සාමා : සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුව සමග විවිධ රාජ්‍යවල ජාතික සංස්කෘතීන් සමීප කර තිබේ.
අමර : ගෝලීය සංස්කෘතිය සාම්ප්‍රදායික, ජන හා ජාතික සංස්කෘතික ප්‍රභේදවලට එකඟ වෙයි.
කුමාර් : සියලු ජාතීන්, සංස්කෘතීන් ඒකාකාරී වීම, සමජාතිය ගෝලීය ගැටලුවකි.
දේවී : ගෝලීය සංස්කෘතිය ලොව ජාතික වාර්ගික සංස්කෘතීන් විනාශ කරමින් ව්‍යාප්ත වන ජන සංස්කෘතියකි.

මේ අතුරින් නිවැරදි ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ,
(1) සාමා, අමර හා දේවී ය.
(2) සාමා, අමර හා කුමාර් ය.
(3) සාමා, කුමාර් හා දේවී ය.
(4) අමර, කුමාර් හා දේවී ය.
(5) අමර, සාමා හා දේවී ය.

47. සමීක්ෂණ ආචාරධර්ම පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - දත්ත ලබා ගැනීමක දී සමීක්ෂකයාගේ බලය අයුතු ලෙස යොදා නොගැනීම.

B - ඕනෑම අවස්ථාවක දත්ත දායකයාට සමීක්ෂණ ක්‍රියාවලියෙන් ඉවත් වීමේ අවස්ථාව ලබා දීම.

මෙම ප්‍රකාශ ඇසුරෙන්,

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.
(4) A හා B සත්‍ය වන අතර, A මගින් B තහවුරු කෙරේ.
(5) A හා B සත්‍ය වන අතර B මගින් A තහවුරු කෙරේ.

48. පාසල් මාධ්‍ය ඒකකය මගින් පළකරන වාර සඟරා ලිපියක සඳහන් කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - විචාරශීලී මාධ්‍ය පරිහරණය
මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ අවබෝධය

B - මාධ්‍ය ප්‍රතිපත්ති කමිටුවක් පත් කිරීම
මාධ්‍ය නියාමනය

C - තොරතුරු පරිහරණය පිළිබඳ අවබෝධය
යහපත් පුරවැසියකු ලෙස සංවර්ධනයට දායක වීම

D - අවස්ථාවෝචිත භාෂා භාවිතය
නිර්මාණශීලී කුසලතා වර්ධනය

ඉහත කරුණු අතුරෙන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමේ අවශ්‍යතාව පිළිබඳ අවම වැදගත්කමක් සහිත කරුණු ඇතුළත් වරණය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා C පමණි.
(4) B හා D පමණි. (5) C හා D පමණි.

49. සන්නිවේදන සමීක්ෂණයක පියවර සම්බන්ධයෙන් පහත සඳහන් A, B, C, D සිද්ධි යුගල අධ්‍යයනය කර පිළිතුරු සපයන්න.

A - බුද්ධි කලම්බනය - ගැටලුව හඳුනා ගැනීම
B - අරමුණ හඳුනා ගැනීම - නිගමනවලට එළඹීම
C - දත්ත රැස්කිරීම - වාර්තාව ලිවීම
D - නිගමනවලට එළඹීම - වාර්තාව ලිවීම

එක් එක් යුගලයෙහි අන්තර්ගත කරුණු අතර වඩාත් සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරන්නේ,

(1) A හා B වේ. (2) A හා C වේ. (3) A හා D වේ. (4) B හා C වේ. (5) C හා D වේ.

50. ජනමාධ්‍ය ග්‍රාහකයින් පස් දෙනෙකුගේ මාධ්‍ය භාවිතය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

A - උදෑසන රූපවාහිනි පුවත්පත් කියවීම් නැරඹීමෙන් පසු නගරයට ගොස් පුවත්පතක් මිලදී ගනියි.

B - ජංගම දුරකථනයෙන් උදෑසන ගුවන්විදුලි ප්‍රවෘත්ති විකාශනයට සවන්දී ලැබී ඇති ප්‍රවෘත්ති කෙටි පණිවිඩ (News Alerts) කියවයි.

C - රාජකාරියට යන අතරතුර සුහුරු ජංගම දුරකථනය (Smart Phone) මගින් පුවත් වෙබ් අඩවිවලට සහ සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශ වෙයි.

D - රාත්‍රී නින්දට පෙර රූපවාහිනි ප්‍රවෘත්ති හා ගුවන්විදුලි ප්‍රවෘත්ති වෙබ් අඩවිවලින් නිරීක්ෂණය කොට පුවත්පත් වෙබ් පිටු සමාජ මාධ්‍ය මගින් කියවයි.

E - යූ ටියුබ් (Youtube) මගින් චිත්‍රපටියක් නරඹා ෆේස්බුක් (facebook) මගින් ප්‍රවෘත්ති පෝස්ට් (Post) කියවයි.

ඉහත ග්‍රාහකයින් අතරින් මාධ්‍ය අභිසාරිතාව සමග වඩාත් සමීප වන ග්‍රාහක කාණ්ඩය වන්නේ,

(1) A, B, C හා E ය. (2) A, C, D හා E ය. (3) B, C, D හා E ය.
(4) B, D හා E ය. (5) C, D හා E ය.

* *

## II පත්‍රය

## A කොටස

- **2008 (පැරණි) සහ 2018 (නව) විෂය නිර්දේශ දෙකටම පොදු විෂය කොටස්වලින් සකස් කර ඇත. මෙම කොටසින් ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) වාචික සන්නිවේදනයට අයත් කාර්ය **හතරක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන **හතරක්** නම් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතියේ සුවිශේෂතා **තුනක්** පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ජනමාධ්‍ය කාර්යභාරයට අයත් කරුණු **හතරක්** පදනම් කරගෙන ඒවා වර්තමාන ජනමාධ්‍යවල භාවිත කරන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

02. දෛනික ජීවිතය හා මාධ්‍ය අතර සම්බන්ධතාව වඩාත් අර්ථපූර්ණ කරගැනීමේ දී මාධ්‍ය සාක්ෂරතාව හා විචාරශීලීත්වය වැදගත් වේ.

(i) යුරෝපා කොමිසම මගින් ඉදිරිපත් කර ඇති නිර්වචනයට අනුව මාධ්‍ය සාක්ෂරතාවට අදාළ ප්‍රධාන කරුණු **දෙකක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) මාධ්‍ය විචාරයේ අවශ්‍යතාව කරුණු **දෙකක්** ඔස්සේ කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) රූපවාහිනී ප්‍රේක්ෂකයා විචාරශීලී වීමේ වැදගත්කම කරුණු **තුනක්** ඔස්සේ පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ''මාධ්‍ය සාක්ෂරතාවෙන් පොහොසත් රටක්'' මැයෙන් පහත තේමා යටතේ පුවත්පතකට වචන 300ට නොඅඩු ලිපියක් සකස් කරන්න.

- සන්නිවේදකයා
- සන්දේශය
- ග්‍රාහකයා
- බලපෑම **(ලකුණු 16යි.)**

03. ''නිර්මාණශීලීත්වය හා සන්නිවේදනය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි''.

(i) ගුවන්විදුලි මාධ්‍ය භාෂා භාවිතයේ දී සැලකිය යුතු කරුණු **හතරක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) ඔබ පාසලේ ප්‍රතිරූපය වර්ධනය සඳහා වන නිර්මාණශීලී මහජන සම්බන්ධතා ක්‍රමෝපාය **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) නිර්මාණාත්මක සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යොදාගත හැකි සාම්ප්‍රදායික විධික්‍රම **තුනක්** උදාහරණ සහිතව පහදන්න. **(ලකුණු 12යි.)**

(iv) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ **හතරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

## B කොටස

- **මෙහි 4, 5, 6 සහ 7 ප්‍රශ්න 2008 (පැරණි) විෂය නිර්දේශය අනුව සකස් කර ඇති අතර 8, 9, 10 සහ 11 ප්‍රශ්න 2018 (නව) විෂය නිර්දේශය අනුව සකස් කර ඇත. මෙම කොටසින් ඕනෑම ප්‍රශ්න තුනක් (03) තෝරාගෙන පිළිතුරු සපයන්න.**

04. ජනමාධ්‍ය කර්මාන්තය මෙහෙයවනු ලබන්නේ දේශපාලන හා ව්‍යාපාරික කණ්ඩායම් මගිනි.

(i) ජනමාධ්‍ය ව්‍යාප්තිය මගින් නිර්මාණය වූ ලෝකය පිළිබඳ සංකල්පය නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) ඇන්වීම්කරණය මගින් සංස්කෘතියට කරනු ලබන බලපෑම කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) ජනමාධ්‍ය මගින් පුද්ගලයාගේ දෛනික න්‍යාය පත්‍රය ගොඩ නංවන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පහදන්න. **(ලකුණු 12යි.)**

(iv) ඓතිහාසික හා දේශපාලන මාධ්‍ය විචාර ප්‍රවේශ **දෙක** සුදුසු උදාහරණ දක්වමින් විග්‍රහ කරන්න. **(ලකුණු 16යි.)**

05. ජාතික වශයෙන් අර්බුද අවස්ථාවක දී රජය විසින් මාධ්‍ය සන්දේශ වාරණය භාවිතයට ගනු ලබයි.

(i) සමාජ මාධ්‍ය වාරණය කිරීම නිසා සමාජයට සිදුවන යහපතට සහ අයහපතට අදාළ ව කරුණු **දෙක** බැගින් නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) මහජන සම්බන්ධතා කටයුතු සඳහා ෆේස්බුක් මගින් ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** දක්වා ඉන් **එකක්** විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) "ප්‍රස්තාව පිරුළු ස්වදේශීය දැනුම හා ප්‍රඥාව පිළිබිඹු කරයි." ප්‍රස්තාව පිරුළුවල පවතින සන්නිවේදනාත්මක වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) සංවර්ධන ව්‍යාපෘතියක දී ඇගයුම් ක්‍රියාවලියෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න කරුණු **හතරක්** ඇසුරෙන් විග්‍රහ කරන්න. **(ලකුණු 16යි.)**

06. (i) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) ජන සන්නිවේදන ක්‍රියාවලියේදී සන්දේශයට සිදුවන හානිය ප්‍රධාන බාධක වර්ග **දෙකට** අදාළව නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) පුවත්පත් කතුවැකිය වැදගත් වන්නේ ඇයි දැයි දැක්වීමට හේතු **හතරක්** සඳහන් කර, ඉන් **දෙකක්** පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විවිධ මත ප්‍රකාශ කළ බටහිර විද්වතුන් **හතරදෙනකු** නම් කර, ඉන් දෙදෙනකු සංවර්ධනයට අදාළව ඉදිරිපත් කළ කරුණු **දෙක** බැගින් ගෙන වෙන වෙනම විග්‍රහ කරන්න. **(ලකුණු 16යි.)**

07. (i) අංකිත මුද්‍රණ ක්‍රමයේ වැදගත් ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) ගෝලීය මාධ්‍යයන්හි සංස්කෘතික කටයුතු සංසරණයේ අසමබරතාව පෙන්නුම් කරන කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) මහජන සම්බන්ධතා කටයුතුවලදී ඡායාරූප භාවිත කළ හැකි ආකාර **හතරක්** දක්වා, ඉන් **දෙකක්** පහදන්න. **(ලකුණු 12යි.)**

(iv) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි **හතරක්** උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

08. ඇමෙරිකාවේ සිට මහාචාර්ය විමල් දිසානායක පැවැත් වූ ''සන්නිවේදන මාධ්‍ය අධ්‍යයනය හා එහි ප්‍රවණතා'' යන දේශනයට අන්තර්ජාලය ඔස්සේ සජීවී ව සම්බන්ධ වීමට මෙරට සිසු දරුවන් පිරිසකට අවස්ථාව උදා විය.

(i) ඉහත අවස්ථාව අයත් වන සන්නිවේදන වර්ගය නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) එම සන්නිවේදන වර්ගයේ සුවිශේෂතා **හතරක්** දක්වා ඉන් **එකක්** පිළිබඳ විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) අධ්‍යාපනික කාර්ය සඳහා දෘශ්‍ය සන්නිවේදනය යොදාගත හැකි ආකාර **තුනක්** පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ගෝලීයකරණය හේතුවෙන් මාධ්‍ය ක්ෂේත්‍රයෙහි සිදු වී ඇති නව ප්‍රවණතා **හතරක්** නිදර්ශන සහිතව විග්‍රහ කරන්න. **(ලකුණු 16යි.)**

09. සමාජ ජාල මාධ්‍ය ඔස්සේ එක් රැස් වූ තරුණ තරුණියෝ රට ලස්සන කිරීමේ අරමුණින් සිතුවම් අඳිමින් නගරයේ තාප්ප අලංකාර කරති.

(i) සමාජ මාධ්‍යයෙහි යෙදවුම් (Apps) **දෙකක්** සහ කාර්ය **දෙකක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) නගර අලංකරණය සඳහා විවිධ රටවල තොරතුරු නව මාධ්‍ය ඔස්සේ ලබාගත හැකි ක්‍රම **දෙකක්** නිදසුන් සහිතව විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) ගැමි ජීවන සම්ප්‍රදායයේ රිද්මය ගැමි කවිය තුළ අන්තර්ගතව පවතී. ජන කවි තුළ දක්නට ලැබෙන සන්නිවේදන ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. **(ලකුණු 12යි.)**

(iv) සමාජය හා සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයට වඩා ප්‍රබල බලපෑමක් සමාජ මාධ්‍ය ඇති කරයි. පක්ෂව හෝ විපක්ෂව කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

10. මාධ්‍ය ක්ෂේත්‍රය තුළ කාලීනව ඇතිවන නව ප්‍රවණතා හේතුවෙන් ඊට අදාළ නියාමනය හා ප්‍රතිපත්ති ද පුළුල් වීම වැළැක්විය නොහැකි ය.

(i) මාධ්‍ය නියාමනය සඳහා භාවිත කරන මූලික ප්‍රවේශ **හතර** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) ව්‍යවහාරය හා භාවිතය මුල් කරගනිමින් ඇතිවන මාධ්‍ය ප්‍රවණතා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) මාධ්‍ය නියාමනයට අදාළ ශ්‍රී ලාංකීය ආයතන **හතරක්** නම් කර ඉන් **දෙකක්** පිළිබඳ විස්තර කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ජනමාධ්‍යයන්හි වාර්තාවන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ග්‍රාහකයා තුළ පවත්නා ආකල්ප විමසා බැලීමේ සමීක්ෂණයක දී භාවිතයට ගත හැකි දත්ත රැස් කිරීමේ ක්‍රමවේද **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

11. ග්‍රාමීය ප්‍රදේශයක ආරම්භ කිරීමට නියමිත රසායනික කර්මාන්ත ශාලාවක් පිළිබඳ ප්‍රජාවගෙන් විරෝධයක් එල්ල විය.

(i) මෙවැනි ගැටුමක් නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රජාව සමග පවත්වන සාකච්ඡාවක් සාර්ථක කරගැනීමට ගතහැකි පියවර **හතරක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) මෙම කර්මාන්තශාලාව ආරම්භ කිරීමේ දී අදාළ ප්‍රාදේශීය රාජ්‍ය ආයතනයකින් කර්මාන්තශාලා හිමිකරුවන්ට අයුතු වරප්‍රසාද ලැබී ඇති බවට ප්‍රජාව තුළ මතයක් පැතිර යමින් පවතී. එම මතය අදාළ රාජ්‍ය ආයතනයට අහිතකර ලෙස බලපෑමට හේතුවන කරුණු **දෙකක්** විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) යහපත් භෞතික පරිසරයක් ගොඩනැගීම සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රධාන අවශ්‍යතාවකි. කරුණු **තුනක්** දක්වමින් නිදසුන් සහිත ව විස්තර කරන්න. **(ලකුණු 12යි.)**

(iv) කර්මාන්තශාලාව වෙත එල්ල වී ඇති විරෝධය කළමනාකරණය කරගැනීම සඳහා කර්මාන්තශාලාවේ මහජන සම්බන්ධතා නිලධාරියාගේ කාර්යභාරය කරුණු **හතරක්** ඔස්සේ පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

* * *